# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2214/4 - 2021 පෙබරවාරි මස 08 වැනි සඳුදා - 2021.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 17745 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2020 දෙසැම්බර් මස 28 වැනි දින අංක 2208/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "අධ්‍යයන ක්‍රියාකාරකම් මගින් වන ව්‍යාපාර කළමනාකරණපති උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. (එස්එල්කිවුඑෆ් 10 වන මට්ටම) ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමේ දී -

(i) කළමනාකරණය හෝ ව්‍යාපාර හා ආර්ථික විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් ප්‍රථම උපාධියක් ලබා තිබීම ; හෝ

(ii) අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම හෝ ඊට ඉහළ සුදුසුකමක් සහිත වීම ; හෝ

(iii) එස්එල්කිවුඑෆ් 6 වන මට්ටමට සමාන හෝ ඊට ඉහළ වෘත්තීය සුදුසුකමක් සහිත වීම ; හෝ

(iv) නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි, ජීපීඒ අගය 0-4 පරිමාණයකින් අවම වශයෙන් 3ක අගයක් සහිතව එන්වීකිව් 7 වන මට්ටම සම්පූර්ණ කිරීම.

අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම විය යුතු ය.

2. (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) යාන්ත්‍රි විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම, අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම විය යුතු ය.

3. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධි ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

***II වන උපලේඛනය***

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය | එම්බීඒ |
| යාන්ත්‍රි විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු)<br>(යාන්ත්‍රි විද්‍යුත් ඉංජිනේරු) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

02 -468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.